# රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත
## 5 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2020 මාර්තු මස 03 දිනැති අංක 2165/12 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.03 යටතේ වන සහ ධීවර අමාත්‍යාංශයේ ලියාපදිංචි දේශීය ටින් මාළු නිෂ්පාදන කර්මාන්තකරුවන් එම අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව ආනයනය කරනු ලබන ජැක් සහ හෝස් මැකරල් (Jack and horse mackerel -*Trachurus spp.*/රේගු සංකේතාංක 0303.55) මසුන්, සඳහා අදාළ වන10% හෝ කිලෝ ග්‍රෑමයකට රු. 150 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 6 ක් අයකරගෙන ඉතිරි ප්‍රමාණය අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය 2020 අගෝස්තු මස 22 දින සිට ආරම්භ වන මාස 03 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, වලංගුව පැවතිය යුතුය.

මහින්ද රාජපක්ෂ
මුදල් අමාත්‍ය

2020 අගෝස්තු මස 21 වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.